පළාත් පාලන දෙපාර්තමේන්තුව (බස්නාහිර පළාත)
உள்ளூராட்சித்திணைக்களம்(மேல் மாகாணம்)
DEPARTMENT OF LOCAL GOVERNMENT (WESTERN PROVINCE)

අපගේ දැක්ම :- "යහපාලනයෙන් සපිරි ඵලදායී පළාත් පාලන සේවාවක්"

| | | |
|---|---|---|
| මගේ අංකය / எனதுஇலக்கம் / My No. LGD/2A/පොදු | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | දිනය / திகதி / Date 2020.04.04 |

බස්නාහිර පළාතේ
සියළුම පළාත් පාලන ආයතන ප්‍රධානීන් වෙත,

**<u>කොරෝනා හදිසි වසංගත තත්ත්වය යටතේ හදිසි මරණ කටයුතු සිදු කිරීම.</u>**

උක්ත කරුණ සම්බන්ධ බස්නාහිර පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/COVID-19 හා 2020.04.03 දිනැති ලිපිය හා බැඳේ.

02. කොරෝනා ආසාදනයට ලක්වී මිය යන්නන්ගේ අවමංගල්‍ය කටයුතු හදිසියේ සිදුකල යුතු බැවින් ඒ සම්බන්ධව ක්‍රියාකල යුතු ආකාරය, ප්‍රවාහනය, අවමංගල්‍ය කටයුතු සිදුකරන ස්ථානය වැනි පළාත් පාලන ආයතන වලින් ඉටුවිය යුතු කාර්යයන් සෞඛ්‍ය බලධාරීන්ගේ උපදෙස් අනුව අදාල පළාත් පාලන ආයතන වල මැදිහත් වීමෙන් සිදු කරන ලෙස එමගින් දන්වා ඇත.

03. ඒ අනුව, කොවිඩ් 19 හදිසි මරණයකට අදාලව හිමිකම් සඳහා කිසිවකු ඉදිරිපත් නොවන අවස්ථාවක එවැනි සිරුරක් ආදාහනය සඳහා අවශ්‍ය වන අවමංගල්‍ය ශාලාවකින් ඉටු විය යුතු කාර්යයන් ඉටුකර ගැනීම සඳහා වන වියදම් හා කාර්යයන් අදාල පළාත් පාලන ආයතනය මගින් සිදු කරන ලෙසත් ඒ වෙනුවෙන් දරනු ලබන වියදම් පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් පසුව ප්‍රතිපූරණය කිරීමට කටයුතු කරනු ලබන බව දන්වමි.

04. තවද, කොරෝනා ආසාදනයට ලක්වී මිය යන්නන්ගේ අවසන් කටයුතු කඩිනමින් ඉටුකල යුතු නිසා කොරෝනා රෝගීන් වෙත ප්‍රතිකාර කරනු ලබන රෝහල් ආසන්නයේ ඇති සුසාන භූමි වල පිහිටි ආදාහනාගාර පැය 24 තුලම විවෘතව තබා ගැනීමට අවශ්‍ය බව 2020.04.02 දින පැවති බස්නාහිර පළාත් කොරෝනා මර්දන විශේෂ කාර්ය සාධන බලකා රැස්වීමේදී සාකච්ඡා වූ බැවින් ආදාහනාගාර වල නිලධාරීන් හා සේවකයින් සූදානමින් තබා ගන්නා ලෙස බස්නාහිර පළාතේ සියලුම පළාත් පාලන ආයතන ප්‍රධානීන් වෙත දැනුම් දෙන ලෙස ප්‍රධාන ලේකම්ගේ අංක CSWP/ADM/11-47/FI/08/2020 හා 2020.04.03 දිනැති ලිපියෙන් මා වෙත දන්වා ඇති බවද වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

කසුන් ඇපා සෙනෙවිරත්න,
පළාත් පාලන කොමසාරිස්,
බස්නාහිර පළාත.

පිටපත් - 1. ප්‍රධාන ලේකම් (බ.ප) - දැ.ගැ.ස
2. ආණ්ඩුකාර ලේකම් (බ.ප) - දැ.ගැ.ස
3. ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය (බ.ප) - දැ.ගැ.ස
4. පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (බ.ප) - දැ.ගැ.ස හා අ.ක.ස
5. පළාත් පාලන සහකාර කොමසාරිස් (කොළඹ/ගම්පහ/කළුතර) - දැ.ගැ.ස හා අ.ක.ස

ලිපිනය / முகவரி/Address අංක 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල / இல.204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுள்ள / No. 204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla

| දුරකථන / தொலைபேசி / Telephone | පොදු General | කොමසාරිස් Commissioner | පාලන හා මානව සම්පත් Admin / HR | නීති Legal | සැලසුම් Planning | ගිණුම් Accounts | විමර්ශන Investigation | ආයතන පරිපාලන Establishment | ප්‍රජා සංවර්ධන Community Development |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 2093156 | 2092570 | 2092574/2092576 | 2092572 | 2092571 | 2092573 | 2092580 | 2092582 | 2092583 |

ෆැක්ස් / பெக்ஸ்/ Fax 2092577 වෙබ් ලිපිනය/ வெப்தளம்/Web www.lgd.wpc.gov.lk ඊමේල් /ஈமெயில்/ Email lgd@wpc.gov.lk